Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# මහජන පුස්තකාල සේවකයන්ගේ රැකියා තෘප්තිය පිළිබඳ අධ්‍යයනයක් : කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභාවලට අයත් මහජන පුස්තකාල ඇසුරින්

**ඩී.පී.ආර්.එල් ගුණරත්න** [1]
**ඩබ්.කේ.එම්.එම්.කේ වීරසිංහ**[2]

**සංක්ෂේපය**

ලොව පවතින විවිධ පුස්තකාල වර්ග අතර මහජන පුස්තකාල සඳහා හිමිවන්නේ සුවිශේෂි ස්ථානයකි.පාඨකයන් වර්ග කිරීමකින් තොරව ජාති,ආගම්,වයස් භේද නොසලකන එය සැමට සේවය සපයන පොදු විඥාපන ආයතනයකි.එවන් වටිනාකමකින් යුතු වූ මහජන පුස්තකාල සේවකයන්ගේ රැකියා තෘප්තිය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ.

පුස්තකාලවල සේවය කරනු ලබන සේවකයන්ගේ සේවා තෘප්තිය එම පුස්තකාලවල සේවා තත්වය වර්ධනය කිරීම කෙරෙහි බලපානු ලබයි.ඒ අනුව මෙම අධ්‍යයනය මගින් මහජන පුස්තකාලවල පුස්තකාල සහකාරවරුන්ගේ සේවක තෘප්තිය කෙරේ බලපාන සාධක හඳුනා ගැනීම හා එම ගැටළු තත්වයන් මගහරවා ගැනීමේලා ඉවහල්වන සාධක හඳුනාගැනීමත් මෙම අධ්‍යයනයේ සෙසු අරමුණු වේ.

පර්යේෂණ ක්‍රමය වශයෙන් සමීක්ෂණ ක්‍රමය භාවිතා කරන ලදී. ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල 1135 ක් පමණ වේ.කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පුස්තකාල 26ක් ඇත.එම පුස්තකාලවල සහකාරවරු 67 දෙනෙකු සේවයෙහි නිරත වේ.ඒ අනුව සංගහණය වන්නේ උක්ත දැක්වූ 67 වේ. නියැදිය වශයෙන් පුස්තකාල එකොළහක සේවකයන් 28 දෙනෙකු යොදා ගත්හ.

රුවන්වැල්ල,ගෝනගල්දෙනිය,අමිතිරිගල,ඉඹුලාන,ගලපිටමඩ,ගලිගමුව,පිටගල්දෙනිය,බටුවත්ත, යටියන්තොට,කිතුල්ගල,අමනාවල,යන මහජන පුස්තකාල මෙහිදී නියැදිය වශයෙන් භාවිතා කරන ලදී. ඉහත නියැදිය වෙත ප්‍රශ්නාවලියක් යොමු කරගනිමින් ප්‍රාථමික දත්ත එකතු කරන ලදී.දත්ත විශ්ලේෂණය සඳහා එක්ස්සෙල් මෘදුකාංගය භාවිතා කරන ලදී

පර්යේෂණයෙහි නිගමන වශයෙන් මෙම පුස්තකාල තුළ සේවය කරන්නන් තෘප්තිමත්ව සේවයෙහි නිරත නොවන බව පෙනුණි.වැටුප හා රක්ෂණ ප්‍රතිලාභ අඩුවෙන් ලැබීම,සේවය අගය කිරීමක් සිදු නොවීම,පුහුණු පාඨමාලාවන්ට යොමු නොකිරීම හා පාඨකයන්ගෙන් නිසි ඇගයීමක් නොලැබීම යන හේතූන් මූලික වශයෙන් ඔවුන්ගේ සේවයෙහි තෘප්තියක් ඇති නොවීම කෙරෙහි බලපා ඇත.

ඔවුන්ගේ සේවක තෘප්තිය වර්ධනය කිරීම සඳහා වැටුප් මට්ටම ඉහල නැංවීම,රක්ෂණ ප්‍රතිලාභ ප්‍රමාණවත් අයුරින් ලබා දීම,සේවය අගයකොට ගෞරවනීය සේවාවක් බවට අත්පත් කර දීම,පුහුණු පාඨමාලාවන් සඳහා යොමු කිරීම යනාදිය යෝජනා වශයෙන් ඉදිරිපත් කළ හැකිය.

**ප්‍රමුඛ පදඃ මහජන පුස්තකාල, පුස්තකාල කළමනාකරණය, පුස්තකාල සේවා, රැකියා තෘප්තිය, සේවක අභිප්‍රේරණය**

---

*1. පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව* ruchiragunarathne3@gmail.com

2. *මහාචාර්ය, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව* waw@kln.ac.lk